**<u>මහජනතාව වෙත කෙරෙන දැනුම් දීමයි</u>**

**1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත සහ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත**

දැනට ලංකාවේ බලපැවැත්වෙන 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත සහ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත් භාෂාත්‍රයෙන් 2025.09.18 වන දින රජයේ මුද්‍රණාලය විසින් ඔවුන්ගේ වෙබ් අඩවියේ Bills (කෙටුම්පත්) – Rent Repeals and Protection of Occupants ලෙස පළ කර ඇත.

එබැවින් මෙම කෙටුම්පත් පිළිබඳව ඔබගේ අදහස්, නිර්දේශ, යෝජනා ඇත්නම් 2026.03.04 වන දිනට හෝ එයට පෙර ලේකම්, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

එම තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ලියුම් කවරයේ වම් කෙළවරේ "1972 අංක 7 දරන ගෙවල් කුලී පනත ඉවත් කිරීම සඳහා වූ පනත සහ පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සඳහා යෝජනා" යනුවෙන් සඳහන් කොට පහත ලිපිනය වෙත යොමු කිරීමට හෝ එසේ නොමැති නම් legal@moj.gov.lk විද්‍යුත් ලිපිනයට යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලේකම්**
**අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය,**
**නො. 19,**
**ශ්‍රී සංඝරාජ මාවත,**
**කොළඹ 10.**

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ ගෙවල් කුලී ඉවත් කිරීමේ පනත් කෙටුම්පතේ සම්පූර්ණ පාඨය සඳහා ප්‍රවේශය -

පදිංචිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත

https://documents.gov.lk/view/bills/2025/9/634-2025_S.pdf

ගෙවල් කුලී ඉවත් කිරීමේ පනත් කෙටුම්පත

https://documents.gov.lk/view/bills/2025/9/633-2025_S.pdf

ලේකම්

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය